විෂය ප්‍රතිපෝෂක සම්මන්ත්‍රණ මාලාව - 2016 ( බාහිර විභාග)
සවිප්‍ර 1.1 - සමාජ විද්‍යාවේ මූලධර්ම
දේශක : ජ්‍යෙ. කථි.ආචාර්ය චන්ද්‍රිමා ගයත්‍රි විජේසුන්දර
සමාජ විද්‍යා අධ්‍යයනාංශය
රුහුණ විශ්වවිද්‍යාලය

## සමාජ ක්‍රියාව සහ සමාජ අන්තර් ක්‍රියාව(Social action &Social interaction)

සමාජය යනු සමාජ ක්‍රියාව හා සමාජ අන්තර් ක්‍රියාව මත පදනම් වූවක් වේ. අන්තර්සබඳතා සිදුවීම තුළින් එකිනෙකා අතර අවබෝධය වර්ධනය වන අතර ඒ ඔස්සේ සමාජය ද සංවර්ධනය වේ. මැක්ස් වෙබර් සමාජ විද්‍යාවේ අරමුණ ලෙස සඳහන් කළේ සමාජ ක්‍රියා අධ්‍යයනය කිරීමයි.

සමාජ අන්තර්ක්‍රියාව යනු පුද්ගලයින් එකිනෙකාට ඇති සම්බන්ධ තාවය අනුව ක්‍රියා කිරීම හා ප්‍රතික්‍රියා දැක්වීමය. මෙම අන්තර්ක්‍රියා පැවැත්වීම ඔස්සේ පුද්ගලයින් ඔවුන් ජීවත්වන සමාජ යථාර්තය ගොඩනගා ගනී. උදා. පවත්නා සමාජ සම්බන්ධතා) එම අන්තර්ක්‍රියා සඳහා මගපෙන්වීමක් සිදුකරයි. මෙය සමාජ ජීවිතයේ යතාර්ථය තේරුම්ගැනීම සඳහා පවතින ප්‍රධාන සංකල්පයකි. සමාජ අන්තර්ක්‍රියාව යනු පුද්ගලයන් දෙදෙනෙකු හෝ ඊට වැඩිපිරිසක් අතර අන්‍යෝන්‍ය අවශ්‍ය තාවයට අනුව කටයුතු කිරීමයි. උදා. දේශනයක් පැවැත්වීම, ක්‍රීඩාවක් කිරීම.

සමාජ අන්තර්ක්‍රියාවල ස්වරූපය අනුව ප්‍රභේද 03 ක් දක්වා ඇත.

✓ හුවමාරු අන්තර්ක්‍රියා: Exchange Interaction

කිසියම් ප්‍රතිලාභයක් හෝ ලාභයක් අපේක්ෂාවෙන් පුද්ගලයන් අන්‍යෝන්‍යාව ක්‍රියා කිරීම මෙනම් වේ. උදා. අත්තම් ක්‍රමයට වැඩ කිරීම.

✓ සහයෝගීතා අන්තර්ක්‍රියා: Cooperative Interaction

කිසියම් පොදු ඉලක්කයක් හෝ අරමුණක් සපුරාගැනීම සඳහා පුද්ගලයින් සාමූහිකව ක්‍රියා කිරීමයි. උදා. දේශපාලන පක්ෂයකට බැඳී ක්‍රියාකිරීම. ආගමික පිළිවෙතකට සහභාගී වීම.

✓ ගැටුම් අන්තර්ක්‍රියා: Conflict Interaction

එක්වී ක්‍රියා කරන පුද්ගලයන් අතර අසමතුලිත හෝ අසමාන අපේක්ෂාවන්හෝ ඇගයුම් පවතී නම් ගැටුම් අන්තර්ක්‍රියා සිදුවේ. එසේම සමාජයකට හිමි සම්පත් හෝ ප්‍රතිලාභ ඉතා සීමිතව පවතින විටකදී ද ඒවා ලබා ගැනීම සඳහා තරඟකාරීත්වයක් ඇතිවීමට ඉඩ තිබේ.

1. ව්‍යුහ කෘත්‍යවාදී ප්‍රවේශය (Structural functional theory)
   මෙහිදී සමාජ සම්බන්ධතා අනුව පුද්ගලයින් අතර අන්තර් ක්‍රියා පැවැත්වීම මගින් පුළුල් සමාජ සම්බන්ධතා ජාලය හෝ සමාජ ව්‍යුහය ආරක්ෂාවන අයුරු විග්‍රහ කෙරේ. මෙය එක් එක් තත්වයට අදාල යුතුකම් හෙවත් කර්ය කොටස් ඉටුකිරීමයි. මේ පිළබඳ පුළුල් ලෙස තත්වය හා කාර්ය කොටස යන මාතෘකාව යටතේ විස්තර කෙරේ.
2. සූක්ෂ්ම මට්ටමේ දිශානතිය (Micro level orientation)
   සමාජයෙහි පුද්ගලයන් දෙදෙනෙකු හෝ කිහිපදෙනෙකු අතර කිසියම් අවස්ථාවකදී සිදුවන අන්ත්ර්ක්‍රියාවක් විග්‍රහ කිරීම සඳහා මෙම ප්‍රවේශය භාවිතාවේ. මේ සඳහා න්‍යායන් කිහිපයක් ඉදිරිපත්වී තිබේ.

## තත්වය සහ කාර්ය කොටස

සමාජයක පුද්ගල අන්තර් සබඳතා නිර්මාණය වී ඇත්තේ තත්වයන් හරහාය. මෙම තත්වයන්ට අදාල කාර්ය කොටස් ඉටු කිරීම මත සමාජ සම්බන්ධතා සුරක්ෂිත වීමද, සමාජ සමූහ සුරක්ෂිත වී පැවතීමද, සමාජ අනුකලනයත් හා පිළිවෙලක් පැවතීමද සිදුවේ.

"ඕනෑම පුළුල් සමාජයක් හෝ කුඩා සමාජ ඒකකයක් හෝ සකස් වී ඇත්තේ අන්තර් සම්බන්ධිත පුද්ගල සමූහයන් මගිනි. මෙම අන්තර් සම්බන්ධතාවයන් දැල් රටාවක් පරිදි පිළියෙල වී ඇත."

– රල්ෆ් ලින්ටන්

තත්වය: Status

තත්වය යනු පුද්ගලයෙකු සමාජයෙහි සෙසු අයට සාපේක්ෂව උසුලනු ලබන සමාජ තනතුරයි. තත්වය යනු ගරුත්වය නොවේ. උදා. මව සහ පුතා. රැල්ෆ් ලින්ටන් (1936) The study of Man. පුද්ගලයා සමාජ ක්‍රමය තුල උසුලන ලබන ස්ථානය වේ. උදා. පුතා, මිතුරා, අසල්වැසියා.

කාර්ය කොටස/ භූමිකාව: Role

යම්කිසි තත්වයක් දරනු ලබන අයෙකුගෙන් අපේක්ෂා කරනුලබන හැසිරීමයි. යම් තනතුරක් දරන පුද්ගලයෙකු එයට අදාළ කර්යකොටස ඉටුකිරීමට බැඳී සිටී.(රැල්ෆ් ලිටන් 1937) ශිෂ්‍යයෙකුගේ තත්වය හිමිකරගැනීම නිසා පන්තියට සහභාගීවීම,පැවරුම් සම්පූර්ණකිරීම, පුළුල් වශයෙන් ඉගෙනීමේ කටයුතුවලට වැඩි කාලයක් යොමුකිරීමට අපේක්ෂිතය.

තත්වයේ ප්‍රභේද

1. ආරෝපිත තත්වය
2. සාධිත තත්වය

තත්වයේ සැබෑ ක්‍රියාකාරිත්වය කාර්ය කොටස වේ. තත්වය මෙන්ම කාර්ය කොටස ද ගතිකය. කාර්ය කොටස් කිහිපයක් පුද්ගලයකු විසින් එකවර ඉටුකිරීමට යාමේදී කාර්ය කොටස් ගැටුමක් (Role Conflict) ඇති වේ.

තත්වය හා කර්යකොටස් අතර පවතින සම්බන්ධ තාවය :

අ. සෑම පුද්ගලයෙකු තත්වයන් රැසක් හිමිකර ගැනීම හා ඒ අනුව වගකීම් රැසක්ද හිමිවීම.

ආ. තත්වයේ ගතික ස්වභාවය කාර්යකොටස වේ. වගකීම් ඉටුකිරීම මත තත්වයන් සුරක්ෂිත වේ.

ඇ. තත්වයන් ක්‍රමයෙන් වර්ධනය වීම හා කර්යකොටස්ද ඊට සමගාමීව වර්ධනය වීම.

ඈ. තත්වයන් හැරීමත් සමග කාර්ය කොටස් හැරීමක් ද සිදුවේ.

ඉ. අත්හරින ලද තත්වයන් වත්මන් කර්යකොටස් ඉටුකිපැහැරීම කෙරෙහිද බලපෑම් කරයි.

ඊ. තත්වයන් රැසකට අදාළ කර්යකොටස් ඉටු කිරීමේදී කාර්ය කොටස් ගැටුම් ඇතිවේ.

ඉ. තනි එක තත්වයකට අදාළ වගකීම් රැසක් ඉටුකිරීමේදී කර්යකොටස් සංරෝධනයක් සිදුවේ.

මෙහිදි පහත සඳහන් කාරණා කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත්ය

- ප්‍රධාන තත්වය: Master status
- කාර්ය කොටස/ භූමිකාව: -Role
- කාර්යකොටස් කුලකය: Role Set
- කාර්යකොටස් ගැටුම: Role Conflict
- කාර්යකොටස් සංරෝධනයන්: Role Constraint
- කාර්යකොටස් ගැටුම් අවමකර ගැනීම: Minimizing Role Conflict
- කාර්යකොටස් පැහැර හැරීම: **Role Exit**

__විවාහය හා පවුල MARRIAGE AND FAMILY__

විවිධ සමාජයන් හි විවාහ සංස්ථාවේ ස්වරූපයන් වෙනස් වන බැවින් විවාහය පිළිබඳ තනි නිර්වචනයක් දීම දුෂ්කරය. අඹුසැමියන් අතර අන්‍යෝන්‍ය වගකීම් හා අයිතිවාසිකම් සලසා දෙන හා ඔවුන්ට උපදින දරුවන්ගේ නෛතික භාවය සලසා දෙන සාපේක්ෂ වශයෙන් ස්ථාවරවූ එක් වීමක් විවාහය ලෙස සැලකේ. විවාහය සෑම සමාජ අවධියකදීම දක්නට ලැබෙන, ලොව සෑම සමාජයකම නොනැසී ක්‍රියාත්මක වන සුළු විශ්වීය සමාජ සංස්ථාවක් ලෙස සැලකේ.

1. ස්ත්‍රී පුරුෂ ශ්‍රම විභජනයක අවශ්‍යතාව

2. ළදරුවන්ගේ දීර්ඝ කාලීන සුරක්ෂිතභාවය
3. ලිංගික තරගකාරීත්වය පාලනය
4. දරුවන් වෙත උරුමයන් පැවරීම යනාදිය විශ්වීය සමාජ සංස්ථාවක් ලෙස විවාහයේ වැදගත්කම් වේ

**විවාහයෙහි ආර්ථික ස්වරූපයන්**

ලොව සමාජයන්ගෙන් 75% ක පමණ විවාහයේ දී කිසියම් ආර්ථික හුවමාරුවක් සිදුවේ

- අඹු මිළ :- Bride Price
- අඹු සේවාවන් :- Bride Service
- ස්ත්‍රීන් හුවමාරුව :- Exchange of Female
- ත්‍යාග හුවමාරුව :- Gift Exchange
- දායාදය :- Dowry

**විවාහ රටාවන්**

- අන්තර්ජන්‍ය විවාහ :- Endogamy
- බහිර්ජන්‍ය විවාහ :- Exogamy
- ඒක විවාහ :- Monogamy
- බහු විවාහ :- Polygamy
- බහු පුරුෂ විවාහ :- Polyandry

**පවුල FAMILY**

පවුල යනු විවාහය හෝ ලේ ඥාතීත්වය මගින් සම්බන්ධ වී එකට වාසය කරන්නා වුත් ආර්ථික හා අවේගාත්මක වශයෙන් එකිනෙකට සහයෝගයක් දක්වන්නා වුත් ඒකකයකි. මෙහි ප්‍රධාන ස්වරූපයන් දෙකකි.

1. න්‍යෂ්ටික පවුල (Nuclear Family)
2. විස්තෘත පවුල (Extended family)

**පවුල් පදිංචි රටාවන් Residential Patterns**

- පීතෘ වාසික පවුල Patrilocal family
- මාතෘ වාසික පවුල Matrilocal family
- නව වාසික පවුල Neolocal family

G.P.Murdock විසින් ලොව පුරා සමාජ දෙසීයක් පමණ අධ්‍යයන කර පවුලෙහි ප්‍රධාන කෘත්‍යයන් 04 ක් පෙන්වා දී ඇත.

1. ලිංගික කෘත්‍ය Sexual function
2. ප්‍රජනන කෘත්‍ය Reproductive function
3. ආර්ථික කෘත්‍ය Economic Function
4. අධ්‍යාපන කෘත්‍ය Education / socialization function

ටැල්කොට් පාසන්ස් (Talcott Parsons) අනුව පවුල විසින් සමාජයේ වෙනත් ආයතනයකට සිදු කළ නොහැකි ප්‍රධාන කාර්යය 02 ක් පවතී.

1. ප්‍රාථමික සමාජානුයෝජනය - Primary Socialization
2. වැඩිහිටි පෞරුෂය ස්ථාපනය - Stabilization of Adult Personality

**ආගම (Religion)**

සමාජ ආයතනයක් ලෙස ආගම මිනිසුන්ගේ විශ්වාස සහ ඇදහිලි සමග බද්ධ වූවක් වේ. ඩර්කයිම්ට අනුව ආගම යනු ශුද්ධ යැයි සම්මත විශ්වාස සහ භාවිතයන් පද්ධතියක් වටා බැඳුණු අන්තර් රඳා පැවැත්මක් ඇති යම්

සමාජයක පුද්ගලයින් සියල්ල එක් සදාචාර ප්‍රජාවක් ලෙස සංවිධානය කරන ආයතනයකි. ඊ.බී. ටයිලර් ට අනුව ආගම යනු අධි භෞතික සත්ත්වයින් පිළිබඳ විශ්වාසයයි.

**<u>නිර්වචන</u>**

(a) දෛනික ජීවිතයෙහි ඇති අන්තරාදායක බව හා වික්ෂිප්ත බව තුළින් ශාන්ත බවක් සොයා යාම සඳහා මිනිසා තුළ පවතින නොනවතින්නා වූ ප්‍රයත්නය ආගමෙහි සාරයයි.

Edward Sapir - එඩ්වඩ් සපීර්

(b) වෙන් කොට ගනු ලැබුවා වූත් තහනම් කර සිටිනු ලැබුවා වූත් ශුද්ධ වූ වස්තූන් සමගින් ඒකාබද්ධ වී පවත්නා වූත් සහ විශ්වාස හා පිළිවෙත් හා සම්බන්ධ වූත් ක්‍රමයකි.

Emile Durkheim - එමිල් ඩර්කයිම්

(c) මිනිසා සහ මිනිසා අතර පමණක් නොව මිනිසා සහ ඉහළ බලවේගයන් අතර පවතින සම්බන්ධතාවයයි.

Maclever & Page - මැක්ලීවර් සහ පේජ්

(d) අධි භෞතික බලවේගයන් පිළිබඳ පවතින ආකල්පයයි.

Ogburn - ඔග්බර්න්

(e) පීඩිත ජනතාවගේ සුසුමයි, හදවතක් නැති ලෝකයේ අභිප්‍රායයි. ආත්මයක් නැතියවුන්ගේ ආත්මයයි. එය ජනතාවගේ අබිං විශේෂ විශේෂයකි.

Karl Marx - කාල් මාක්ස්

(f) පරිසරය හා මානව ජීවිතය මෙහෙයවනු ලබන හා පාලනය කරනු ලබන මිනිසාට වඩා උසස් වූ බලවේගයන් පිළිබඳ විශ්වාසයයි.

James Frazer - ජේම්ස් ෆ්‍රෙසර්

**<u>ආගමෙහි කෘත්‍යයන්</u>**

(a) ආගමික අත්දැකීම් ලබා දීම
(b) සාමකාමී මනසක් ඇති කිරීම
(c) සමාජ ඒකාබද්ධතාවය වර්ධනය කිරීම
(d) ජීවිතයෙහි අර්ථවත් බව සුරැකීම
(e) සමාජ පාලන මාධ්‍යයක් ලෙස ක්‍රියා කිරීම
(f) සමාජ සුභසාධනය වර්ධනය කිරීම
(g) විනෝදාස්වාදයක් ලබා දීම
(h) පුද්ගල දුක්ඛ දෝමනස්සයන් පැහැදිලි කර පෞරුෂය අනුකලනයක් ඇති කිරීම

**<u>ආගමෙහි දුෂ්කෘත්‍යයන්</u>**

(a) සමාජ ප්‍රතිවිරෝධතාවයන් නැති කිරීම හා සමාජ වෙනස්වීමට බාධා වීම
(b) සමාජ වෙනස්වීමට අනුගාමීව බාධා වීම
(c) නව අදහස් ඇති වීම වැලැක්වීම
(d) රඳා පැවැත්මක් ඇති කිරීම

**<u>ආගම පිළිබඳ සමාජ විද්‍යාත්මක පැහැදිලි කිරීම්</u>**

- එමිල් ඩර්කයිම්ගේ විග්‍රහය
- මැක්ස් වෙබර්ගේ විග්‍රහය
- කාල්මාක්ස්ගේ අදහස්

<u>අධ්‍යාපනය</u>

වර්තමානයේ කවර හෝ සමාජයක පවතින ආයතන අතර අධ්‍යාපනය ඉතාමත් වැදගත් සාධකයක් වේ. අධ්‍යාපනය මගින් කෙරෙන විධිමත් සමාජානුයෝජනය ඉතාමත් සංවිධානාත්මකව සිදුවන ක්‍රියාවලියකි. අධ්‍යාපනය විධිමත් සංවිධානයක් වූ අතර එය සතුව මනාව හඳුනාගත් අරමුණු පවතී. එකී අරමුණු මුදුන්පත් කර ගැනීම සඳහා නිශ්චිත ව්‍යුහයක් සහ ක්‍රියාමාර්ගයක් ද පවත්නේය. සංවිධානයන්ට විධිමත් හා අවිධිමත් ව්‍යුහයක් පවතී. සමාජ සංස්ථා අතර අධ්‍යාපනයට හිමිවනුයේ වැදගත් ස්ථානයකි. මිනිස් චර්යාව දෙස බලන කළ සමාජයේ පුද්ගලයා අනෙකුත් පුද්ගලයන් සමග ඇතිකරගත් සම්බන්ධතා මත තම චර්යාව ගොඩනගා ගනී. මෙය ඉගෙනීමය. වර්තමානයේ දක්නට ලැබෙන මුළු සමාජයටම පොදු අධ්‍යාපනික ක්‍රියාවලිය මෑතකදී ආරම්භ වූ අතර ආරම්භයේ සිටම යම් පමණක විධිමත් අධ්‍යාපන රටාවක් පැවතුණි. උදා:- පන්සල් හා වෙනත් ආගමික ආයතනවල මූලිකත්වයෙන් දුන් අධ්‍යාපනය. පූර්ව කාර්මික සමාජවල මෙම විධිමත් අධ්‍යාපනය හිමි වූයේ සීමිත පිරිසකටය. උදා:- පූජ්‍ය පක්ෂය, පුරුෂ පක්ෂය

කාර්මික විප්ලවයෙන් පසු විධිමත් අධ්‍යාපන රටා ලොව පුරා ව්‍යාප්ත විය.

- අධ්‍යාපනය පිළිබඳ කෘත්‍යවාදී විග්‍රහය
- අධ්‍යාපනය පිළිබඳ දුෂ්කෘත්‍යවාදී මතය

<u>නිලබල ක්‍රමය</u>

විධිමත් සංවිධානයක් ක්‍රියාත්මක කිරීම සඳහා සම්බන්ධ වී සිටින කාර්ය මණ්ඩලය හා ඔවුන්ගේ ක්‍රියාකාරිත්වය නිලබල ක්‍රමය මගින් විද්‍යමාන වේ.

<u>ආධිපත්‍ය වර්ගීකරණය</u>

නිලබල ක්‍රමය පිළිබඳ වෙබර්ගේ විග්‍රහය ඇරඹෙන්නේ ආධිපත්‍ය නම් සංකල්පය පැහැදිළි කිරීමෙනි. ඒ අනුව වෙබර් ආධිපත්‍ය වර්ග 03 ක් හඳුනා ගනී.

1. සාම්ප්‍රදායික ආධිපත්‍යය(Traditional Athourority)
2. අනුහස්/කරිස්ටා ආධිපත්‍යය(Charismatic Authority).
3. තාර්කික නීත්‍යානුකූල ආධිපත්‍යය (Rational Legal Authority)

<u>නිලබල ක්‍රමයේ පරමාදර්ශී ලක්ෂණ</u>

වෙබර් ඉදිරිපත් කළ නිලබල ක්‍රමය පිළිබඳ පරමාදර්ශී වර්ග (ideal type of bureaucracy) පහත අයුරින් ඉදිරිපත් කළ හැකිය.

i. ශ්‍රම විභජනය (Division of labour)
ii. අධිකාරිමය ධූරාවලිය (Hierarchy of Authority)
iii. අපෞද්ගලිකත්වය (Impersonality)
iv. නීති හා රෙගුලාසි (Laws and Regulations)
v. තාක්ෂණික නිපුණතාව (Technical Qualifications)
vi. පූර්ණ කාලීන පත්වීම් (Fultime Appointments)
vii. කාර්යාලය (Office)

<u>සමාජ අපගමනය (Social Devience)</u>

අපගමනය යනු සංස්කෘතික ප්‍රතිමානයක් බිඳ දැමීමයි. සංස්කෘතික ප්‍රතිමාන යනු සමාජයක සාමාජිකයින්ගේ හැසිරීමට මග පෙන්වන පරිදි ස්ථාපිත පොදුවේ පිළිගත් හා අනුමත සමාජ රීතින්ය.
ප්‍රතිමාන මගින් සමාජයක පුද්ගලයින් විසින් සපුරාගත යුතු ඉලක්කයන් හා එම ඉලක්ක සපුරාගැනීමට අනුගමනය කල යුතු මාධ්‍යයන් ද පෙන්වා දි තිබේ.
උදා :- ආදායම්, විනෝදය, ආහාර, ලිංගික අවශ්‍යතා

| ප්‍රතිමානක චර්යා | අපගාමී චර්යා | |
|---|---|---|
| අනුමත සංස්කෘතික වශයෙන් හැසිරීම | සංස්කෘතික වශයෙන් අනුමත නොකළ හැසිරීම | නීතිමය වශයෙන් අනුමත නොකළ හැසිරීම |
| මාර්ග නීති පිළිපැදීම, අන්‍යයන්ට උදව් කිරීම, වෙහෙස වී වැඩකර ඉපයීම, දෙමාපියන් රැකබලා ගැනීම. | සිගා කෑම, විවාහයෙන් පරිබාහිර ලිංගික සබඳතා අන්‍යයන්ගේ නිදහසට බාධා කිරීමකි. | සොරකම, මිනී මැරීම, පහරදීම |

**අපගාමී චර්යාවන් පිළිබඳ හේතු සාධක**

- පෞරුෂමය සාධක
- සමාජ විද්‍යාත්මක සාධක

**අපගමණය පිළිබඳ සමාජ විද්‍යාත්මක න්‍යායන්**

1. ව්‍යුහකෘත්‍ය න්‍යාය Structural functional theory
2. ගැටුම් න්‍යාය Conflict theory
3. සංකේතාත්මක අන්තර්ක්‍රියා න්‍යාය Symbolic Interaction theory

**<u>ධනවාදය හා අපගමනය</u>**

කාල් මාක්ස්ට අනුව ධනවාදයට එරෙහිව නැගී සිටින පුද්ගලයන් අපගාමින් ලෙස සැලකේ. ධනවාදය පෞද්ගලික දේපල ක්‍රමය මත පදනම් ව ඇති අතර ඊට ප්‍රතිරෝධතා දක්වන දිළින්දන් අපගාමින් ලෙස හඳුනාගෙන ඇතග

**<u>අපගාමී චර්යා ප්‍රභේද</u>**

1. දෛනික අපරාධ Street Crimes
2. වෘත්තීය අපරාධ Professional Crimes
3. සංවිධානාත්මක අපරාධ Organized Crimes
4. සුදු කරපටි අපරාධ White Collar Crimes
5. දේශපාලනික අපරාධ Political Crimes

**<u>අපගාමී චර්යා වැලැක්වීම</u>**

1. පලිගැනීම Retribution / Revenge
2. වැලැක්වීම Deterrence / Prevention
3. පුනරුත්ථාපනය Rehabilitation / Treatment
4. සමාජ සුරක්ෂිත භාවය Social Protection

**<u>සමාජ පාලනය (Socail Control)</u>**

සමාජීය පාලනය යන්නෙන් අදහස් කරනු ලබන්නේ සමාජයක ඇති ප්‍රතිමාන හා සාරධර්මවලට අනුකූලව කටයුතු කළ යුතුය යන්නට කෙරෙන බලපෑමකි. මේ බලපෑම යටතේ සංරෝධකයන් සමාජයක් විසින් පිහිටුවාගෙන ඇත. මේ අනුව සමාජීය පාලනය යනු සමාජය ප්‍රතිමානික චර්යාව (Normative Behavior) ක්‍රියාවට නැංවීමේ ප්‍රතිඵලයකි.

සමාජීය පාලනය යටතේ ප්‍රධාන වශයෙන් කරුණු 2 ක් දැක්විය හැකිය.

1. මානව සත්ත්වයාගේ අපගාමී චර්යාවන් වැළැක්වීම
2. අපගාමීවූවන්ට දඬුවම් පැමිණවීම මගින් ඔවුන් මාවත යහමගට ගැනීම